**ශීර්ෂය 203- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

ශීර්ෂය **203**- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයය අංක 5-1058 ආගමික හා දහම් පාසැල් ක්‍රියාකාරකම් යටතේ මූලික ඇස්තමේන්තුවෙන් රු.8,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වූ මෙම වැය විෂයය සඳහා වෙන් කර ගන්නා ලද ප්‍රතිපාදනයෙන් රු.2,636,193 ක් එනම් සියයට 33ක් ඉතිරි කර තිබුණි | 05/1508 වැය විෂය යටතේ ප්‍රතිපාදන වශයෙන් රු.8,000,000 ක් සලසා තිබුණද වියදම් වශයෙන් රු.5,363,807ක් දරා ඇති අතර 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව උත්සව අවලංගු කිරීම හා අනෙකුත් වියදම් සීමා කිරීම මත මෙම ඉතිරිය ඇති වී ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනයට අදාල මු.රෙ. 135 බලය බෙදීම, ස්ථාන මාරුවීම් හා අභ්‍යන්තර විගණනය පිළිබඳ තොරතුරු ලිඛිතව විගණකාධිපති වෙත දන්වා ඇත. 2022 වසර සඳහා ඉන් අමතරව විශේෂිත මූල්‍ය පාලන පද්ධතියේ වෙනස්කමක් සිදු නොකළ බැවින් උක්ත තොරතුරුවලට පරිබාහිරව වෙනත් තොරතුරු විගණකාධිපති වෙත යොමු කර නොමැත.<br><br>එසේ වුවද, ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව ඉදිරියේදී අදාල සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීම් නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01හි දක්වා ඇති පරිදි ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ධාවන සේවා සටහන් මාසිකව ඉදිරිපත් කරනු ලැබූ අතර එහි අඩංගු කරුණුම ප්‍රවාහන සේවා සටහනේද අඩංගු බැවින් වෙන වෙනම ප්‍රවාහන සේවා සටහන් ඉදිරිපත් නොකල අතර ඉදිරියේ දී වෙන වෙනම ප්‍රවාහන සේවා සටහන් ද ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ii) | අංක පී/එෆ්/අරමුදල්/04/152 හා 2015 ජූලි 14 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ අංක PFD/ZNFR/TRPT/CC/02 හා 2017 පෙබරවාරි 15 දින දරන රාජ්‍ය මුදල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | රාජ්‍ය ආයතන තම ආයතනික අවශ්‍යතාව අනුව රක්ෂණ ආවරණයන් සලසා ගැනීම ගනුදෙනුවල විනිවිදභාවය, අවදානම් කළමනාකරණය මෙන්ම පිරිවැය කාර්යක්ෂමතාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වෙළඳපල තුළ ක්‍රියාත්මක රක්ෂණ සේවාවන් සපයන ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුලින් තරඟකාරී ලෙස සිදු කර ගත යුතු වුවත් මිල කැඳවීමෙන් තොරව වාහන රක්ෂණ කටයුතු ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් සිදු කරවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | මිල ගණන් කැඳවීම සිදු කරන අවස්ථාවේදී වාහනයේ තක්සේරු වටිනාකම ලබා ගත යුතුව ඇති බැවින් ඒ සඳහා ද මුදලක් වැය වේ. තවද අනතුරක් සිදු නොවීම හේතුවෙන් වර්ෂ අවසානයේ හිමි වන හිමිකම් නොපැමේ ප්‍රතිලාභ මුදලද වසරින් වසරට අඩුවන අතර එය රජයට වාසියක් වන අතර එම මුදල අහිමි වීමද රජයට අලාභයක් වනු ඇත. කෙසේ වුවද උක්ත චක්‍රලේඛය ප්‍රකාරව ලබන වසරේ සිට මිල කැඳවීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා දී තිබූ 2021 අංක 30 දරන විසර්ජන පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද 2022 සැප්තැම්බර් 02 දිනැති 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධිත) සම්මත වීමෙන් පසු ඊට අනුකූලව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2022 වසර සඳහා දළ සංශෝධිත සැලස්මක් ආයතනික වශයෙන් පවත්වාගෙන ගියද එය විධිමත් පරිදි සකසා නොතිබුණි. 2023 වසර සඳහා සංශෝධිත සැලැස්මක් සකස් කරමින් පවති. | සංශෝධිත විසර්ජන පනත ප්‍රකාරව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වීම. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සැප්තැම්බර් 13 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 11 දින අවසන් කළ යුතුව තිබූ මරදමඩු දේවස්ථානයේ වන්දනා ගෘහයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 23 දින අවසන් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 2.5 ක වියදමක් දරා තිබුණි. පළමු අදියර වශයෙන් ගොඩනැගිල්ලේ පාදම සහ කණු පමණක් ඉදි කර වර්ෂ 05 ක් ගත වී තිබුණද ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. ඒ හේතුවෙන් මෙතෙක් දරා තිබුණු රු.මි.2.5 ක මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය කෙරේ. | මෙම ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් නොයෙක්වර ඇස්තමේන්තු ගෙන්වා ගැනීමට ඉල්ලීම් කලද යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි. 2018 හා 2019 වසරවල ඉදිකිරීම සම්පූර්ණ කර ගැනීමට දරන ලද උත්සාහයන් අසාර්ථක වීම මත මෙම සංවර්ධන කටයුත්ත අඩාලව පැවතිණ.<br><br>අංක 2145/55 හා 2019/10/19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මඩු සිද්ධස්ථානය පූජා භූමියක් බවට පත් කිරීම නිසා දෙපාර්තමේන්තුවට එකී සිද්ධස්ථානයේ සංවර්ධන කටයුතු ස්වාධීනව සිදු කල නොහැකි බවත් සංවර්ධන කටයුතු සිදු කරන්නේ නම් මෙහෙයුම් කමිටුවක් අධීක්ෂණය යටතේ ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කර භාවිතයට ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| | සිදු කල යුතු බවත් 2021 පෙබරවාරි 24 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී සඳහන් කෙරිණි. කොරෝනා වසංගතය හේතුවෙන් අදාළ රැස්වීම් පවත්වාගත නොහැකි විය. ඉදිරියේදී මෙහෙයුම් කමිටු රැස්වීම් නොපැවැත්වුවද ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව හා එක්ව 2024 අයවැය ප්‍රතිපාදන තුලින් වැඩකටයුතු නිම කිරීමට පියවර ගන්නා බවද දන්වනු කැමැත්තෙමි. | |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් තලවිල වාරිකා නිවාසය කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉදි කර තිබූ අතර එම ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත් තලවිල වන්දනා ගෘහය 2006 ජුනි 28 දින ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයට පරිහරණය සඳහා පවරා දී ඇති අතර නැවත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස වරින් වර ඉල්ලීම් කරන ලදී. එසේ වුවද මෙය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම සිදු කරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මඟින් බැවින් එම ඉඩම නැවත පවරා දෙන ලෙසට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් මඟින් වරින් වර ඉල්ලීම් කළ ද ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස කල්පිටිය ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා එවා ඇත. ඊට අවශ්‍ය උපදෙස් හා පහසුකම් සලසා දෙන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇත. | ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරින් අතුරින් ගණකාධිකාරි හැර අනෙකුත් නිලධාරින්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැබීමට හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛණයක් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අතර මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | | |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 12 දින අනතුරට ලක්වූ අංක NB 2558 දරන වාහනයට සිදුවූ රු.137,707 ක අලාභය මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර කපා හැරීමට ද කටයුතු කර නොතිබුණි. | අනතුරට අදාලව නීතිපතී දෙපාර්තමේන්තුව මගින් රු 137,707 ක මුදල ගෙවන ලෙස අනතුරට අදාල අනෙක් පාර්ශවය වෙත දන්වා ඇතත් එකී මුදල ජනරජයට ගෙවීම පැහැර හැර ඇති බැවින් නීතිපති විසින් නඩු පවරා ඇත. | අලාභය අය කර ගැනීමට හෝ කපා හැරීමට අවශ්‍ය කටයුතු කල යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 61 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහකාර අධ්‍යක්ෂ තනතුර, සංවර්ධන නිලධාරී තනතුරක්, කළමණාකරන සේවා නිලධාරී තනතුරු 3 ක් සහ කාර්යාල සේවක සේවයේ තනතුරක් ඇතුළුව තනතුරු 6 කට අදාළව පුරප්පාඩු පැවතුණි. | සහකාර අධ්‍යක්ෂ, කළමණාකරණ සේවා නිලධාරී සහ කාර්යාල කාර්ය සහයක තනතුරු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ PACIS මෘදුකාංගයේ යාවත්කාලීන කරනු ලබන අතර කාර්තුමය වාර්තාවක් වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතද දැනුවත් කර ඇත.<br><br>සංවර්ධන නිලධාරී තනතුර ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකු වෙනුවට අනුප්‍රාප්තික නිලධාරියෙකු නොපැමිණීම හේතුවෙන් පුරප්පාඩුවී පවතී. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ක් එකම සේවා ස්ථානයේ සේවා කර ඇති නිලධාරියෙකුට වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 සිට 17 කට වැඩි කාලයක් | ස්ථානමාරු චක්‍රලේඛය ප්‍රකාරව වසර 5ට වඩා වැඩි සේවයේ නියුතු නිළධාරීන්ගේ විස්තර සහ ස්ථානමාරු ඉල්ලූ නිලධාරීන්ගේ විස්තර නිර්දේශ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ සේවා ජනරාල් වෙත වාර්ෂිකව නියමිත දිනයට පෙර ලබා දෙන අතර එම නිළධාරින්ට ස්ථානමාරුවීම් ලබා දීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීමක් හා කාර්යභාරයක් වේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

සම්පූර්ණ කරන ලද නිලධාරීන් 27 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.